(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(5).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 ජුනි 20 සිකුරාදා**

**2025 ජූලි 08 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*

සුදු ක්‍රීඩා නියාමන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විනිමය පත්‍ර (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සමෘද්ධි (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මැයි 19 දිනැති අංක 2437/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

**2025 ජූලි 11 සිකුරාදා**

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

පා. 55/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන ආරක්ෂා කිරීම,— රත්නපුර දිස්ත්‍රික්කයේ කොළොන්න ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඓතිහාසික ස්ථානයක් වන මඩුවන්වෙල වලව්ව ප්‍රමුඛ ශ්‍රී ලංකාවේ ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන බොහෝ ප්‍රමාණයක් පවතින හෙයින් ද, එම ස්ථාන සංචාරක ආකර්ශණයට ලක් වී ඇති හෙයින් ද, වර්තමානය වනවිට එවැනි ස්ථාන දැඩි අනාරක්ෂිත තත්ත්වයට පත් වී ඇති හෙයින් ද, මෙම ස්ථානවල මුල් පෞරාණිකභාවයට හානියක් නොවන ලෙස සංරක්ෂණය කොට එම ස්ථාන සතු ඉඩම් කඩිනමින් මැන නිරවුල් කොට අනාගත පරපුර සඳහා ආරක්ෂා කර දෙමින් සංචාරක කර්මාන්තයට යොදා ගැනීම සඳහා ඒවා ආරක්ෂා කිරීමට වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 56/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම,— උඩවලව ජාතික වනෝද්‍යානය, උඩවලව ඇත් අතුරු සෙවණ, සංඛපාල රජමහා විහාරය, උඩවලව ජලාශය, සෙවනගල සීනි කර්මාන්තශාලාව, සෙවනගල උක් පර්යේෂණ ආයතනය, උඩවලව මිරිදිය ධීවර මධ්‍යස්ථානය සහ වවුල්පන හුණුගල් ගුහාව ආදී වූ සංචාරක ආකර්ශණය ලබාගත හැකි ස්ථාන තිබුණද විධිමත් වැඩපිළිවෙළක් නොමැතිවීම හේතුවෙන් දෙස් විදෙස් සංචාරකයන්ට එහි වටිනාකම් ලබාගැනීමට නොහැකි වී ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික්කයේ උඩවලව ප්‍රදේශය සහ මොනරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශය ආවරණය වන පරිදි උඩවලව ප්‍රදේශය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 57/2025

ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා,— "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ආරම්භ කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන මුස්ලිම් ජනතාවගේ අධ්‍යාපනය, සංස්කෘතිය, රැකියාව සහ ජාතීන් අතර පවතින සහයෝගීතාවය සම්බන්ධ ගැටලුවලදී හා එදිනෙදා ජීවනෝපායයන් ඉටුකර ගැනීමේ දී අවශ්‍ය වන අරමුදලක් මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සතුව දැනට නොමැති හෙයින් ද, මෙම අවශ්‍යතාවයන් සඳහා "බයිතුල්මාල්" නමින් අරමුදලක් ලෝකයේ මුස්ලිම් රටවල්වල සහ මුස්ලිම් සුළු ජාතීන් ජීවත්වන රටවල්වල වසර ගණනාවක සිට ස්ථාපනය කර ඇති හෙයින් ද, මෙම අරමුදල ශ්‍රී ලංකාවේ ආරම්භ කළහොත් අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මෙරට ජීවත්වන අයගෙන් සහ විදේශීය රටවල්වල ජීවත්වන අයගෙන් සම්පාදනය කරගත හැකිවන හෙයින් ද, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ "ශ්‍රී ලංකා බයිතුල්මාල් අරමුදල" නමින් අරමුදලක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදුකරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 58/2025

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය,— පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු (Student Counsellor) පත් කිරීම,— වර්තමානයේ බොහෝ පාසල් සිසුන් අතර විවිධ මානසික පසුබෑම් දක්නට ලැබෙන හෙයින් ද, මෙම තත්ත්වයන් ඔවුන්ගේ ශාරීරික හා සමාජීය පැවැත්ම සඳහා වක්‍රාකාරව බලපාන හෙයින් ද, ඇතැම් අවස්ථාවලදී පාසල් සඳහා පාසල් මනෝ උපදේශකවරයන් පත් කර තිබුණ ද එම තනතුර සඳහා පාසල් ගුරුවරුන්ගේ භූමිකාවද ඇතුළත්වීම හරහා ඉන් බලාපොරොත්තු වන සේවය ඵලදායීව සිදු වී නොමැති හෙයින් ද, සෑම පාසලකටම මනෝ උපදේශකයකවරයෙකුගේ අවශ්‍යතාවය මතු වී ඇති හෙයින් ද, පාසල් සිසුන්ගේ අධ්‍යාපන සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය හා පුද්ගල සමාජ සංවර්ධනය සඳහා සෑම පාසලකටම පුහුණුවලත් මනෝ උපදේශකවරයෙකු පත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 59/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වන "රටවිරුවන්" වෙනුවෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය පණ ගැන්වීම සඳහා විදෙස්ගත ශ්‍රමික ප්‍රජාවගෙන් ලැබෙන දායකත්වය ඉතා සුවිශේෂ වන හෙයින් ද, ආර්ථික අර්බුදය හමුවේ විදෙස් රටවල වසර ගණනාවක් රැකියා කිරීමෙන් අනතුරුව නැවත ශ්‍රී ලංකාවට පැමිණ තම දූ දරුවන්ද සමඟින් ජීවිකාව ගෙන යන ඔවුන්ට ඇතැම් අවස්ථාවලදී නැවත රැකියාවක් කිරීමට තරම් හැකියාවක් නොමැතිවීම හේතුවෙන් විවිධ ගැටලුවලට මුහුණපෑමට සිදුවන හෙයින් ද, ඔවුන්ගෙන් විදේශ විනිමය වශයෙන් ලැබෙන මුදලින් යම් ප්‍රතිශතයක් යොදාගෙන විශ්‍රාම අරමුදලක් පිහිටුවා විශ්‍රාම යෝජනා ක්‍රමයක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2025 ජූලි 22 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

162/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023.09.21 සිට 2024.09.20 දක්වා ඛනිජ තෙල් අලෙවි කිරීමෙන් රජය විසින් උපයන ලද බදු ආදායම කොපමණද;

(ii) එම කාලසීමාව තුළදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයන ලද ලාභය/අලාභය කොපමණද;

(iii) එම කාලසීමාව තුළදී ඉන්ධන අලෙවි කිරීමේදී වංචා සිදු වී තිබේද;

(iv) එසේ නම්, ඉන්ධන ලීටරයකින් වංචා කරන ලද මුදල, එක් එක් ඉන්ධන වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) වංචා කරන ලද මුළු මුදල කොපමණද;

(vi) ඉන්ධන ලීටරයකින් වංචා කරන ලද මුදල අඩු කිරීමෙන් පසු ලැබිය යුතු සහනය මේ වනවිට පාරිභෝගිකයන් වෙත ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

183/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ දකුණ එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශයේ රජයේ ඖසුසලක් නොමැති බවත්;

(ii) මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුම්වත් කරන ලද අවස්ථාවේදී රජයේ ඖසුසලක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත ගොඩනැගිල්ලක් නොමැති බව දැන් වූ බවත්;

(iii) එහෙත්, රජයේ ඖසුසලක් ස්ථාපිත කිරීම වෙනුවෙන්ම කළුවාංචිකුඩි මූලික රෝහලේ ගොඩනැගිල්ලක් ඉදිකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, කළුවාංචිකුඩි මූලික රෝහල් පරිශ්‍රයේ ඉදිකර ඇති ගොඩනැගිල්ලේ රජයේ ඖසුසලක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

196/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය තුළ සිදුකර ඇති ඉන්දියානු ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව, එම එක් එක් ආයෝජන ව්‍යාපෘතියේ නම, ආයෝජනයේ වටිනාකම සහ එමඟින් ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ලැබෙන දායකත්වය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයේ කර ඇති ඉන්දියානු ආයෝජන සම්බන්ධයෙන් රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

216/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා සේවක අර්ථසාධක අරමුදලේ සක්‍රිය ගිණුම් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම කාලය තුළ දායකයාට ගෙවන ලද වාර්ෂික පොලී අනුපාතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාර්ෂික පොලී අනුපාතය තීරණය කිරීමේ දී සලකා බලනු ලබන කරුණු කවරේද;

(iv) සේවක අර්ථසාධක අරමුදල තවදුරටත් ශක්තිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

223/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම, මිල්ලනිය ප්‍රදේශයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අපනයන සැකසුම් කලාපය සඳහා ඉඩම් පවරා ගැනීමේ ප්‍රගතිය කවරේද;

(ii) පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වනවිට ගෙවා ඇති වන්දි මුදල කොපමණද;

(iii) ඉහත අපනයන සැකසුම් කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට, එම කලාපයට නල ජලය ලබා දීමට සහ විදුලිය සැපයීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කලාපයේ මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමේ ප්‍රගතිය කවරේද;

(v) ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘතියක් ලෙස සලකා ඉහත අපනයන සැකසුම් කලාපයේ ඉතිරි සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

311/2024

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2024.12.31 වන විට සහ මේ වන විට විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015 වර්ෂයේ සිට මේ දක්වා—

(i) විදේශ රැකියා හරහා ලැබුණු මුළු විදේශ ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් කොපමණද;

(ii) මෙම ප්‍රේෂණ ලැබී ඇත්තේ කුමන රටවල සිටද;

(iii) පැහැර හරින ලද වැඩ කොන්ත්‍රාත්තු හේතුවෙන් පිටුවහල් කරන ලද සංක්‍රමණික සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සේවකයින් සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(v) විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයින් සඳහා වන රක්ෂණ ක්‍රමයෙන් උපයාගත් ආදායම කොපමණද;

(vi) මෙම යෝජනා ක්‍රමයෙන් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

338/2024

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අතීතයේ සිට මහර බන්ධනාගාර පරිශ්‍රයේ පැවති මුස්ලිම් දේවස්ථානය 2019 වර්ෂයෙන් පසුව ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බව දන්නේද;

(ii) ඊට හේතු කවරේද;

(iii) එම දේවස්ථානය නැවත පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අවසරය සහ පහසුකම් ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

443/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවාගැනීම සඳහා පසුගිය කාලයේදී සම්මුඛ පරීක්ෂණ පවත්වා තිබේද;

(ii) එසේ නම්, එම සම්මුඛ පරීක්ෂණවලින් සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) උප පොලිස් පරීක්ෂක තනතුරට බඳවාගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම තනතුර සඳහා බඳවාගැනීම නතර කර තිබේද;

(v) නොඑසේ නම්, උප පොලිස් පරීක්ෂක තනතුර සඳහා බඳවාගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

621/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ගුවන් සේවා සපයනු ලබන ගුවන් සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) මේ වනවිට එම ගුවන් සමාගම් විසින් සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියට ගෙවීමට ඇති හිඟ ණය මුදල ඉහත එක් එක් ගුවන් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිඟ ණය මුදල් අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/2025

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික සාමාන්‍ය සීනි අවශ්‍යතාවය කොපමණද;

(ii) 2023, 2024 වර්ෂවලදී සහ 2025 වර්ෂයේ ආරම්භයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2025 අවසානය වනවිට ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කිරීමට සහ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට අපේක්ෂා කරන සීනි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දේශීයව නිෂ්පාදිත සීනි මත පනවා ඇති බදු වර්ග සහ බදු ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලා සීනි නිෂ්පාදනයෙන් මේ වනවිට අලාභ ලබන බව දන්නේද;

(iii) ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය ආශ්‍රිතව නිර්මාණය වී ඇති ඍජු සහ වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම රැකියා මේ වනවිට දැඩි අවධානමකට ලක් වී ඇති බව දන්නේද;

(v) ශ්‍රී ලංකාවේ සීනි නිෂ්පාදනය ඉහළ නැංවීමටත්, ආනයනය කරනු ලබන සීනි ප්‍රමාණය අඩු කර ගැනීමටත්, ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූලි 23 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

517/2025

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ මේ වනවිට ජාතික පාසල් ලෙස නම් කරන ලද පාසල් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ජාතික පාසලේ නාම පුවරුව හා ප්‍රධාන පිවිසුම් දොරටුව සැකසීම සඳහා ලබා දී ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වනවිට එම පාසල් පාලනය කරනු ලබන්නේ රේඛීය අමාත්‍යාංශය මඟින්ද; නොඑසේ නම්, අදාළ පළාත් සභාව මඟින්ද;

(iv) ඒ අනුව, මේ වනවිට ස්ථාපිත කර ඇති මුළු ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(v) ඒවායේ නම් කවරේද;

(vi) එම ජාතික පාසල්වල භෞතික සම්පත් සංවර්ධනය කර ඒවා රේඛීය අමාත්‍යාංශය යටතට ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

630/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම නවත්වන ලද දිනය කවරේද;

(ii) එම දිනයෙන් පසු රජයේ සේවකයන් සඳහා ආනයනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම ආනයනය කරන ලද වාහන අතරින් මේ වනවිට රජයේ සේවකයන්ට ලබා දී ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(v) එම වාහන ලබා දුන් එක් එක් පුද්ගලයාගේ නම, සේවය කරනු ලබන/ලැබූ ආයතනය සහ තනතුර වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) ආනයනය කරන ලද වාහන අතරින් මේ වනතෙක් රජයේ සේවකයන්ට ලබා දී නොමැති වාහන සංඛ්‍යාව කොපමණද;

(vii) එම වාහන ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

794/2025

ගරු සුජීව දිසානායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ජලාශ, මහා පරිමාණ වැව් හා සුළු පරිමාණ වැව් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති ඉහත වැව් සහ ජලාශ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවා අතරින් පසුගිය වර්ෂ දහය (10) තුළ පිළිසකර කරන ලද සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒවා පිළිසකර කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 'සාර්ප්' නමින් වාරි ව්‍යාපෘතියක් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ පිළිසකර කරන ලද වාරි ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) 'සාර්ප්' ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කළේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන සම්පාදනය කර ගත් ආකාරය කවරේද;

(v) සම්පාදනය කර ගත් මුළු ප්‍රතිපාදනය කොපමණද;

(vi) ඒ අතරින් කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය කොපමණද;

(vii) එම ව්‍යාපෘතිය යටතේ වැවක පිළිසකර කරන ලද අංග කවරේද;

(viii) එම ව්‍යාපෘතිය මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

805/2025

ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1989 පෙබරවාරි 08 වන දින හෝ ඊට ආසන්න දිනයක දී බෞද්ධයන්ගේ මුදුන් මල්කඩ බඳු වූ ශ්‍රී දළදා වහන්සේ වැඩ සිටින ශ්‍රී දළදා මාළිගයේ ආරක්ෂකයන්ට පහර දීමක් සිදු වූ බව දන්නේද;

(ii) එසේ නම්, එම අවස්ථාවේදී පැහැර ගන්නා ලද අවි ආයුධ, සිදු වූ ශාරීරික හා වෙනත් භෞතික හානි වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පහර දීමට සම්බන්ධ වූ පුද්ගලයන් ජනතා විමුක්ති පෙරමුණට හෝ එහි සන්නද්ධ අංශය වූ දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයට සම්බන්ධ බව පොලිස් පරීක්ෂණ අනුව හෙළි වී තිබේද;

(iv) එම පහර දීමට සම්බන්ධ වූ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන තිබේද;

(v) ඔවුන්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

(vi) එම පහරදීමේ අරමුණ දළදා වහන්සේ පැහැර ගැනීම හෝ විනාශ කිරීම බව විමර්ශන අනුව හෙළි වී තිබේද;

(vii) එම සිද්ධියට අදාළ පොලිස් වාර්තා හා විමර්ශන වාර්තා ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

857/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2023 හා 2024 යන වර්ෂවල සීමාසහිත ලංකා පොස්පේට් සමාගම විසින් අපනයනය කරන ලද රොක් පොස්පේට් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එප්පාවල රොක් පොස්පේට් අගය එකතු කිරීමකින් තොරව අපනයනය නොකරන ලෙස දී ඇති බුලංකුලම නඩු තීන්දුවට සහ 2012.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව ඒවා අපනයනය කර ඇති බව දන්නේද;

(iii) පොස්පේට් අපනයනය කිරීම සඳහා ගැනුම්කරුවන්/සමාගම් තෝරා ගැනීමේදී විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව තෝරා ගන්නා ලද සමාගම් කවරේද;

(vi) ලබා දී තිබූ සීමාවන් ඉක්මවා එම සමාගම් විසින් රොක් පොස්පේට් අපනයනය කර තිබේද;

(vii) එසේ නම්, එම එක් එක් සමාගම විසින් සීමාව ඉක්මවා අපනයනය කර ඇති රොක් පොස්පේට් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(viii) 28%ක් වන ප්‍රතිශත සීමාව ඉක්මවා, 38%ක ප්‍රතිශතයකින් යුතු රොක් පොස්පේට් අපනයනය කර ඇති බව දන්නේද;

(ix) එසේ නම්, ඒ හේතුවෙන් සිදු වී ඇති අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

866/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති සංචාරක කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) මාතර දිස්ත්‍රික්කයේ ඇති සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශ කවරේද;

(iii) ඒවා අතරින් ගැසට් පත්‍රයක් මඟින් සංචාරක ස්ථානයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ කවරේද;

(iv) කොටපොල හා පිටබැද්දර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ සංචාරක ආකර්ෂණයක් ඇති ස්ථාන බොහෝමයක් ඇති බව දන්නේද;

(v) එසේ නම්, ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙක ආවරණය වන පරිදි සංචාරක කලාපයක් නම් කරන්නේද;

(vi) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

869/2025

ගරු ටී.කේ. ජයසුන්දර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද අවස්ථාවේ, එම කොමිෂන් සභාවට පවරා දෙන ලද දකුණු පළාතේ ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම් අතරින් මේ වනවිට පුද්ගලික අයිතියට පවරා දී ඇති අක්කර 50ට අඩු ඉඩම් සංඛ්‍යාව, එම එක් එක් ඉඩමේ විශාලත්වය, ඉඩම පවරා දී ඇති පුද්ගලයාගේ නම සහ ඉඩම පවරා දී ඇත්තේ කෘෂිකාර්මික කටයුතු සඳහාද නැතහොත් ව්‍යාපාරික කටයුතු සඳහාද යන්න එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වනතෙක් පවරා හෝ බැහැර කර නොමැති ඉඩම්වල නම් හා ඒවායේ විශාලත්වය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඉඩම් අතරින් මේ වනවිට අධිකරණ ක්‍රියාමාර්ග සිදුවෙමින් පවතින ඉඩම් කවරේද;

(v) නව ව්‍යාපෘති සඳහා ඉල්ලා ඇති ඉඩම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයේ ඉඩම් සඳහා 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලවකවානුව තුළ රජයේ 'දීමනා පත්‍ර' හෝ 'ඉඩම් බලපත්‍ර' ලබා දුන් ඉඩම්වල ජනතාව පදිංචි වී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් සහ අදාළ තොරතුරු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

956/2025

ගරු අජිත් ගිහාන් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුහුදු වෙරළ තීරය මුහුදු ඛාදනයට ලක්වෙමින් පවතින අතර ඒ හේතුවෙන් ඉඩම්, දේපළ සහ ආගමික පිළිම පවා මුහුදට බිලිවෙමින් පවතින බවත්;

(ii) වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මැදිහත් වී එම මුහුදු ඛාදනය වළක්වා ගැනීම සඳහා ක්‍රියා කළද, පැවති රජයන් විසින් ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රතිපාදන වෙන් නොකළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පුත්තලම දිස්ත්‍රික්කයේ, මුහුදු වෙරළ තීරය ඛාදනයවීම වළක්වා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

997/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගාල්ල දිස්ත්‍රික්කය තුළ කර්මාන්ත පිහිටුවීම සඳහා පුද්ගලයන් වෙත ඉඩම් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම්වල මේ වන විට පිහිටුවා ඇති කර්මාන්තශාලා සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම් ලබා දුන් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූලි 24 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

615/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහරගම, අපේක්ෂා රෝහලේ මේ වනවිට ප්‍රතිකාර ලබමින් සිටින රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2025 වර්ෂයේ ආරම්භය වනවිට එම රෝහලේ පරිත්‍යාග ගිණුමට ලැබී තිබූ මුදල කොපමණද;

(iii) 2020 වර්ෂයේ සිට මේ දක්වා එම ගිණුමෙන් භාවිතා කරන ලද මුදල හා භාවිතා නොකරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මහරගම, අපේක්ෂා රෝහලට පරිත්‍යාග ලෙස ලැබෙන මුදල් ඵලදායී ලෙස භාවිතයට ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

638/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා ධීවර සංස්ථාව ධීවරයන්ගෙන් මිලදී ගන්නා ලද මාළු ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම මාළු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මුළු මාළු අස්වැන්නේ ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මාළු මිලදී ගැනීම සඳහා සහ මාළු මිල ස්ථාවර මට්ටමක පවත්වා ගෙන යාම සඳහා ලංකා ධීවර සංස්ථාවේ මැදිහත්වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

652/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්කිස්ස ප්‍රදේශයේ කෘත්‍රිම වෙරළ තීරයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ අරමුණු කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය මේ වනවිට අතරමඟ නවතා ඇති බව දන්නේද;

(v) එම ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

717/2025

ගරු ධනුෂ්ක රංගනාත් මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාභාවික දොළ මාර්ග ආරක්ෂා කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ස්වාභාවික දොළ මාර්ග ආශ්‍රිතව පැවතිය යුතු දොළ රක්ෂිතයට අදාළ භූමි ප්‍රමාණය කොපමණද;

(iii) දොළ රක්ෂිත බලහත්කාරයෙන් අත්පත් කර ගෙන ඇති පුද්ගලයන් සඳහා නීතිය ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දොළ රක්ෂිත සින්නක්කර ඉඩම් ලෙස ලබා දී ඇති බව දන්නේද;

(ii) එලෙස ලබා දී ඇති කළුතර දිස්ත්‍රික්කයේ දොළ රක්ෂිත භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම දොළ රක්ෂිත භූමි නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

721/2025

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඹුක්කන්ඔය ව්‍යාපාරය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපාරය යටතේ නක්කල අමුණ සංවර්ධනය කිරීම සඳහා පසුගිය යහපාලන රජය විසින් පියවර ගෙන තිබූ බව දන්නේද;

(iii) ඒ සඳහා වෙන් කර තිබූ මුදල කොපමණද;

(iv) එම අමුණ සංවර්ධනය කිරීම මඟින් ප්‍රතිලාභ හිමි වන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) එම සංවර්ධන කටයුතු හේතුවෙන් ජලාශයට යටවන ඉඩම් වෙනුවෙන් අදාළ ඉඩම් හිමිකරුවන්ට විකල්ප ඉඩම් ලබා දීමට කටයුතු කර තිබේද;

(vi) මේ වන විට එම සංවර්ධන කටයුතු අඩාල වී ඇති බව දන්නේද;

(vii) එසේ නම්, එම සංවර්ධන කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

807/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරය කවරේද;

(ii) මේ වනවිට ඉහත දෙපාර්තමේන්තුවේ පවතින සේවක පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) රස පරීක්ෂක වාර්තා නිසි වේලාවට නොලැබීම හේතුවෙන් බොහෝ නඩු ප්‍රමාද වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, රස පරීක්ෂක වාර්තා නිසි වේලාවට නිකුත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

954/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් සංවර්ධන නිලධාරී පත්වීම් ලබා දෙන අවස්ථාවේදී විදේශීය විශ්වවිද්‍යාලවල උපාධිධාරීන්ට ලබා දෙන ලද සංවර්ධන නිලධාරී පත්වීම් පසුව අවලංගු කර ඇති බව දන්නේද;

(ii) ඒ සඳහා බලපාන ලද නිශ්චිත හේතු කවරේද;

(iii) එහිදී අගතියට පත්වූ විදේශීය විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් සඳහා ලබා දෙන විසඳුම කවරේද;

(iv) කිසිදු අසාධාරණයකින් හෝ වෙනස්කමකින් තොරව සුදුසුකම් මත විදේශීය විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් ඉදිරියේදී රජයේ සේවයට බඳවා ගන්නේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(vi) 2020 වර්ෂයේදී සංවර්ධන නිලධාරී පත්වීම් ලබා දෙන අවස්ථාව වනවිට වයස අවුරුදු 45 සීමාව සම්පූර්ණ නොකළ, එහෙත් මේ වනවිට එකී සීමාව පසු කර ඇති පුද්ගලයන් ඇතුළුව සංවර්ධන නිලධාරී පත්වීම් අවලංගුකර ඇති පුද්ගලයන් සඳහා ලබා දෙන විසඳුම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

975/2025

ගරු එම්. එස්. උදුමාලෙබ්බෙ මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, උහන සහ පොතුවිල් යන ප්‍රදේශ සඳහා වෙන වෙනම අධ්‍යාපන කලාප පිහිටුවීම සඳහා කටයුතු කරනු ලැබූ අතර ඒ සඳහා නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයාද සිය නිර්දේශ ලබා දුන් බවත්;

(ii) එහෙත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ඒ සඳහා අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, උහන සහ පොතුවිල් ප්‍රදේශ සඳහා වෙන වෙනම අධ්‍යාපන කලාප පිහිටුවීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

994/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, මාතලේ සහ අනුරාධපුරය ඇතුළු නගර ගණනාවක ඛනිජ තෙල් ගබඩා කිරීමේ ටැංකි ඇති බව දන්නේද;

(ii) ශ්‍රී ලංකාව තුළ ඇති මුළු ටැංකි සංඛ්‍යාව කොපමණද;

(iii) එම ටැංකි අයත් අමාත්‍යාංශය කවරේද;

(iv) එම ටැංකිවල සාමාන්‍ය ධාරිතාවය කොපමණද;

(v) වර්තමානයේ දී මෙම ටැංකි භාවිතයට ගැනීමේ සූදානමක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

995/2025

ගරු රුවන්තිලක ජයකොඩි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝග නිෂ්පාදනයේ යෙදී සිටින ගොවියාගේ ජීවන තත්ත්වය උසස් කළ යුතු බවත්;

(ii) ඒ සඳහා, ගොවීන් විසින් විශාල ශ්‍රමයක් සහ මුදලක් යෙදවිය යුතු බවත්;

(iii) එසේ වුවද, කෘෂි නිෂ්පාදන සඳහා ශ්‍රමයට සහ වියදමට සරිලන සාධාරණ මිලක් නොලැබීමෙන් ගොවීන් පීඩාවට පත් වී සිටින බවත්;

(iv) කෘෂි නිෂ්පාදන මිලදී ගැනීමේදී, පාරිභෝගිකයාටද ඉහළ මිලක් ගෙවීමට සිදු වී ඇති බවත්;

(v) ගොවියා සහ පාරිභෝගිකයා අතරමැද සිටින තොග වෙළෙන්දා සහ සිල්ලර වෙළෙන්දා විසින් අධික ලාභ ලබන බවත්;

(vi) ගොවියා සහ පාරිභෝගිකයා යන දෙදෙනාම පීඩාවට පත් කරන ඉහත ක්‍රමය වෙනස් කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ නම්, ගොවියා, වෙළෙන්දා සහ පාරිභෝගිකයා යන තිදෙනාම ආරක්ෂා වන ආකාරයේ වැඩපිළිවෙළක් මේ සඳහා සකස් කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 ජූලි 25 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

15/2024

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා,— වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ සමස්ත තේ නිෂ්පාදනයට කුඩා තේ වතු හිමියන් ලබා දුන් දායකත්වය ප්‍රතිශතයක් ලෙස එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට මුළු කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) කුඩා තේ වතු හිමියන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

(v) කුඩා තේ වතු හිමියන්ගේ ජීවන මට්ටම උසස් කිරීම වෙනුවෙන් ඉහත සඳහන් එක් එක් ආයතනය විසින් සිදු කරනු ලබන කාර්යභාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

115/2024

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් සොයා බැලීමට පත්කරන ලද විවිධ කොමිෂන් සභා මඟින් සිය රාජකාරිය, වගකීම නිසි ලෙස ඉටු නොකිරීම සම්බන්ධයෙන් චෝදනා එල්ල කර ඇති නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන්ගේ නම් හා ඔවුන් මේ වනවිට දරමින් සිටින තනතුරු කවරේද;

(iii) එම නිලධාරීන් අතරින් වත්මන් රජය යටතේ මේ වනවිටත් වගකීම් දරමින් සිටින නිලධාරීන් සිටී නම්, එම නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

163/2024

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024 වර්ෂයට අදාළ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය පැවැත්වීමට පෙර ඊට අදාළ ප්‍රශ්න පත්‍ර හෝ ඒවායේ අන්තර්ගත ප්‍රශ්න බාහිර පාර්ශ්වයන් අතට පත් වී තිබේද;

(iii) ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) එම විභාගයේ පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම අත්හිටුවා තිබුණේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

(vi) ඒ හේතුවෙන් අගතියට පත් සිසුන් සම්බන්ධයෙන් ගන්නා ලද පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

184/2024

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ නිරිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අම්බිලාන්තුරේ සිට කොකට්චෝලේ දක්වා දිවෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කර නොමැති බවත්;

(ii) මේ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුම්වත් කරනු ලැබුවද, එම මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

(iii) පාසල් සිසුන්, රජයේ සේවකයන් ඇතුළුව ප්‍රදේශයේ ජනතාව විශාල පිරිසක් සිය ගමනාගමන කටයුතු සඳහා ඉහත මාර්ගය භාවිතා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, අම්බිලාන්තුරේ සිට කොකට්චෝලේ දක්වා දිවෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

199/2024

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම් ද්‍රෝණිය අවට ගෑස් සහ තෙල් නිධි ගවේෂණය කිරීම සඳහා බලපත්‍ර ලබා දී ඇති සමාගම්වල නම් කවරේද;

(ii) එම බලපත්‍ර ලබා දීමේදී පනවා ඇති කොන්දේසි කවරේද;

(iii) එම ගවේෂණවල වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

217/2024

ගරු රෝහණ බංඩාර මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා කොටස් වෙළඳපලේ ආයෝජනය කර ඇති සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එම මුදල් ආයෝජනය කරන ලද සමාගම් කවරේද;

(iii) එම එක් එක් ආයෝජනයෙන් ලැබූ ලාභ/අලාභ වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

225/2024

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය බව පිළිගන්නේද;

(ii) විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කඩිනමින් ඉදිරිපත් කරන බවට 'පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශය මඟින් පොරොන්දු වී තිබේද;

(iii) එසේ නම්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරනු ලබන දින වකවානු කවරේද;

(iv) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමේ ක්‍රියාදාමය, පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂ සම්බන්ධ වන සර්ව පාක්ෂික ක්‍රියාදාමයක් විය යුතු බව පිළිගන්නේද;

(v) නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කිරීම පිළිබඳ ක්‍රියාදාමයට ජාතික වශයෙන් ප්‍රමුඛතාවයක් ලබා නොදීමට හේතුව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

508/2025

ගරු චාමර සම්පත් දසනායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම අත්හිටුවීමෙන් පසු රජයේ සේවකයන්ට නිකුත් කර ඇති තීරු බදු නිදහස් වාහන බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර සඳහා වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති තීරණය කවරේද;

(iii) එම බලපත්‍ර යටතේ වාහන ආනයනය කිරීම අත්හිටුවා තිබේද;

(iv) එසේ නම්, එම අත්හිටුවීම බලපැවැත්වෙන කාල සීමාව කොපමණද;

(v) එම බලපත්‍ර යටතේ වාහන ආනයනය කිරීම සඳහා අවසර ලබා දෙන්නේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

622/2025

ගරු කිංස් නෙල්සන් මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තා වූ ආපදා සිද්ධීන් සංඛ්‍යාව, එම සිද්ධීන්වලදී ආපදාවන්ට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව සහ එම පුද්ගලයන්ට ගෙවන ලද වන්දි මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ආපදා කළමනාකරණය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ලෝකයේ බොහෝ රටවල් ආපදා කළමනාකරණය සඳහා සුවිශේෂ අවධානයක් යොමු කරන බව දන්නේද;

(iv) ආපදා කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/2025

ගරු පද්මසිරි බණ්ඩාර මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව, හිඟුරක්ගොඩ ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් තිබෙන බව දන්නේද;

(ii) 2024 වර්ෂයේදී එම ක්‍රීඩාංගනයේ උත්සවයක් පැවැත්වූ අතර ඒ සඳහා විශාල මුදලක් අනවශ්‍ය ලෙස වැය කර ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කර තිබේද;

(iv) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොළොන්නරුවේ ජාතික ක්‍රීඩාංගනයක් තිබෙන බව දන්නේද;

(ii) එම ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) ඉදිකිරීමේ දුර්වලතා හේතුවෙන් එම ක්‍රීඩාංගනයේ කොටස් ගණනාවක් කඩා වැටී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---